IslamHouse.com

55 සූරා අර් රහ්මාන්

(අපිරිමිත දයාන්විතයා)

ආයත් 1-78 දක්වා.

අල් කුර්ආනය

< Sinhala>

මාහිර් රම්ඩීන්
පරිවර්තක

ඉස්ලාම් හවුස් වෙබ් අඩවියේ සංස්කරණ මණ්ඩලය
විචාරය කිරීම

ترجمة معاني القرآن الكريم

سورة الرحمن - 55

القرآن الكريم

ترجمة:

ماهر رمدين

مراجعة:

محمد آساد ونخبة من العلماء الكرام

المكتب التعاوني للدعوة وتوعية الجاليات بالربوة
هاتف: ‎+٩٦٦١١٤٤٥٤٩٠٠ فاكس: ‎+٩٦٦١١٤٩٧٠١٢٦ ص ب: ٢٩٤٦٥ الرياض: ١١٤٥٧
ISLAMIC PROPAGATION OFFICE IN RABWAH
P.O.BOX 29465 RIYADH 11457 TEL: +966 11 4454900 FAX: +966 11 4970126
OFFICERABWAH

55 සූරත් අර්-රහ්මාන් (අපරිමිත දයාන්විතයා)

මදීනාවෙහි දී හෙළිදරව් කෙරුණකි.

ආයාත් (වැකි) 78 කි.

بِسْمِ اللهِ الرَّحمنِ الرَّحِيْمِ

අපරිමිත දයාන්විත අසමසම කරුණාන්විත අල්ලාහ්ගේ නාමයෙනි.

1-25 අල්ලාහ් තම ගැත්තන් වෙත කළ ආශිර්වාද සහ එය ප්‍රතික්ෂේප කරන්නන්හට දොස් නැගීම.

අපරිමිත දයාන්විතයාණෝ	الرَّحْمَٰنُ {1}
ඔහු අල් කුර්ආනය ඉගැන්වීය.	عَلَّمَ الْقُرْآنَ {2}
ඔහු මිනිසා ව මැව්වේය.	خَلَقَ الْإِنْسَانَ {3}
ඔහු ඔහුට පැහැදිලි කතාව ඉගැන්වීය.	عَلَّمَهُ الْبَيَانَ {4}
හිරු හා සඳු නියමිත ගණන් විලාසයකට අනුව ගගනය කරයි.	الشَّمْسُ وَالْقَمَرُ بِحُسْبَانٍ {5}
තවද තරු හා ගස යන දෙක ඔහුට සුජූද් කරති.	وَالنَّجْمُ وَالشَّجَرُ يَسْجُدَانِ {6}
තවද අහස ඔහු එය උස් කළේය. තවද (යුක්තියේ) තුලාව පිහිටුවේය.	وَالسَّمَاءَ رَفَعَهَا وَوَضَعَ الْمِيزَانَ {7}
යුක්තියේ තුලාව නුඹලා උල්ලංඝනය නොකරනු පිණිස.	أَلَّا تَطْغَوْا فِي الْمِيزَانِ {8}
තවද නුඹලා සාධාරණයෙන් යුතු ව තුලනය ක්‍රියාත්මක කරනු. තවද නුඹලා තුලාවෙහි අඩු නොකරනු.	وَأَقِيمُوا الْوَزْنَ بِالْقِسْطِ وَلَا تُخْسِرُوا الْمِيزَانَ {9}

وَالْأَرْضَ وَضَعَهَا لِلْأَنَامِ {10}

තවද මහපොළොව එය සියලු ජීවීන් සඳහා තැබුවේ ය.

فِيهَا فَاكِهَةٌ وَالنَّخْلُ ذَاتُ الْأَكْمَامِ {11}

එහි පලතුරු ද කොපු සහිත රටඉඳි ගස් ද ඇත.

وَالْحَبُّ ذُو الْعَصْفِ وَالرَّيْحَانُ {12}

තවද පොතු සහිත ධාන්‍ය ද සුවඳැති පැළැටි ද ඇත.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {13}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

خَلَقَ الْإِنْسَانَ مِنْ صَلْصَالٍ كَالْفَخَّارِ {14}

වළන් මෙන් වියළි මැටියෙන් ඔහු මිනිසා මැව්වේය.

وَخَلَقَ الْجَانَّ مِنْ مَارِجٍ مِنْ نَارٍ {15}

තවද ගින්නෙන් වූ (දුමක් නැති) දැල්ලෙන් ඔහු ජින් වර්ගයා මැව්වේය

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {16}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

رَبُّ الْمَشْرِقَيْنِ وَرَبُّ الْمَغْرِبَيْنِ {17}

(ඔහු) නැගෙනහිරවල් දෙකෙහි හිමිපාණන් හා බටහිරවල් දෙකෙහි හිමිපාණන්ය.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {18}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

ඔහු මුහුදු දෙක එකිනෙකට යාවන්නට හැරිය.	مَرَجَ الْبَحْرَيْنِ يَلْتَقِيَانِ {19}
ඒ දෙක අබිබවා නොයන අයුරින් ඒ දෙක අතර බාධකයක් විය.	بَيْنَهُمَا بَرْزَخٌ لَا يَبْغِيَانِ {20}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {21}
ඒ දෙකින් මුතු හා පබළු මතු වෙයි.	يَخْرُجُ مِنْهُمَا اللُّؤْلُؤُ وَالْمَرْجَانُ {22}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {23}
තවද කඳු මෙන් මුහුදෙහි උසින් ගමන් කරනු ලබන යාත්‍රා ද ඔහුට ඇත.	وَلَهُ الْجَوَارِ الْمُنْشَآتُ فِي الْبَحْرِ كَالْأَعْلَامِ {24}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {25}

26-30 අල්ලාහ්ගේ පැවැත්ම හැර අන් සියලුම මැවීම්හි විනාශය.

ඒ (මහපොළොව) මත ඇති සියල්ල විනාශ වී යන්නක්ය.	كُلُّ مَنْ عَلَيْهَا فَانٍ {26}
තවද තේජාන්විතභාවයෙන් හා ගෞරවාන්විතභාවයෙන් යුක්ත නුඹගේ පරමාධිපතිගේ මුහුණ ශේෂ ව පවතී.	وَيَبْقَى وَجْهُ رَبِّكَ ذُو الْجَلَالِ وَالْإِكْرَامِ {27}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {28}
අහස්හි හා මහපොළොවෙහි සිටින්නෝ(තම අවශ්‍යතාව) ඔහුගෙන් ඉල්ලා සිටිති. සෑම දිනකම ඔහු (තම) කටයුත්තෙහි නිරත ව සිටියි.	يَسْأَلُهُ مَنْ فِي السَّمَاوَاتِ وَالْأَرْضِ ۚ كُلَّ يَوْمٍ هُوَ فِي شَأْنٍ {29}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {30}

31-36 අල්ලාහ්ගේ බලය ඉදිරියේ මිනිස් වර්ගයා සහ ජින් වර්ගයාගේ නොහැකියාව.

අහෝ (මිනිස් හා ජින්) දෙවර්ගයනි! අපි නුඹලා වෙනුවෙන් ඉක්මණින් (විනිශ්චය සඳහා වූ කාලය) වෙන් කරන්නෙමු.	سَنَفْرُغُ لَكُمْ أَيُّهَ الثَّقَلَانِ {31}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {32}
අහෝ ජින් හා මිනිස් සමූහයනි! අහස් හා මහපොළොවේ පැතිකඩ වලින් පලා යෑමට නුඹලා හැකියාව දරන්නේ නම් නුඹලා පලා යනු. මහා බලයකින් මිස නුඹලා පලා නොයනු ඇත.	يَا مَعْشَرَ الْجِنِّ وَالْإِنْسِ إِنِ اسْتَطَعْتُمْ أَنْ تَنْفُذُوا مِنْ أَقْطَارِ السَّمَاوَاتِ وَالْأَرْضِ فَانْفُذُوا ۚ لَا تَنْفُذُونَ إِلَّا بِسُلْطَانٍ {33}

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا
تُكَذِّبَانِ {34}

එහෙයින් (මිනිස් හා ජින් යන)
නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ
කවර ආශිර්වාදයන් නුඹලා
දෙදෙනා බොරු කරන්නෙහු ද?

يُرْسَلُ عَلَيْكُمَا شُوَاظٌ مِنْ نَارٍ
وَنُحَاسٌ فَلَا تَنْتَصِرَانِ {35}

නුඹලා (අයහපත්) දෙවර්ගයට
එරෙහිව ගිනි ජාලා හා දුමාරයක්
එවනු ලැබේ. එවිට නුඹලා
දෙවර්ගය (ඉන් ආරක්ෂා වන්නට)
උදව් නොලබනු ඇත.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا
تُكَذِّبَانِ {36}

එහෙයින් (මිනිස් හා ජින් යන)
නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ
කවර ආශිර්වාදයන් නුඹලා
දෙදෙනා බොරු කරන්නෙහු ද?

37-45 වැරදි කරන්නන්හට හිමි දඬුවම.

فَإِذَا انْشَقَّتِ السَّمَاءُ فَكَانَتْ وَرْدَةً
كَالدِّهَانِ {37}

එහෙයින් අහස පැළී ගිය විට එය
තෙල් මෙන් රතු පැහැ ගැණෙනු
ඇත.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا
تُكَذِّبَانِ {38}

එහෙයින් (මිනිස් හා ජින් යන)
නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ
කවර ආශිර්වාදයන් නුඹලා
දෙදෙනා බොරු කරන්නෙහු ද?

فَيَوْمَئِذٍ لَا يُسْأَلُ عَنْ ذَنْبِهِ إِنْسٌ
وَلَا جَانٌّ {39}

එහෙයින් එදින මිනිසෙකු හෝ
ජින්නුවෙකු හෝ ඔහුගේ පාපය
ගැන විමසනු නොලබයි.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا
تُكَذِّبَانِ {40}

එහෙයින් (මිනිස් හා ජින් යන)
නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ
කවර ආශිර්වාදයන් නුඹලා
දෙදෙනා බොරු කරන්නෙහු ද?

වැරදි කරුවෝ ඔවුන්ගේ සලකුණු වලින් හඳුනා ගනු ලබති. එවිට ඉදිරි නළල් කෙස් රොද හා පාද වලින් ග්‍රහණය කරනු ලබති.

يُعْرَفُ الْمُجْرِمُونَ بِسِيمَاهُمْ فَيُؤْخَذُ بِالنَّوَاصِي وَالْأَقْدَامِ {41}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {42}

වැරදි කරුවන් එය බොරු යැයි පවසන නිරය මෙය වේ.

هَٰذِهِ جَهَنَّمُ الَّتِي يُكَذِّبُ بِهَا الْمُجْرِمُونَ {43}

ඒ අතර හා දැඩි රශ්මිය ලෝදිය අතර ඔවුහු කැරකෙති.

يَطُوفُونَ بَيْنَهَا وَبَيْنَ حَمِيمٍ آنٍ {44}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {45}

46-78 දෙවියන් පිළිබඳ මතකයෙන් පසුවන්නන්ට හිමි ස්වර්ග උයන් පිළිබඳ වර්ණනාවක්.

තම පරමාධිපතිගේ සන්නිධානයේ පෙනී සිටීමට බිය වූවන්ට (ස්වර්ග) උයන් දෙකක් ඇත.

وَلِمَنْ خَافَ مَقَامَ رَبِّهِ جَنَّتَانِ {46}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {47}

සාරවත් අතුවලින් යුක්ත (උයන්) දෙකකි.

ذَوَاتَا أَفْنَانٍ {48}

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {49}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

فِيهِمَا عَيْنَانِ تَجْرِيَانِ {50}

ඒ දෙකෙහි ගලා යන උල්පත් දෙකකි.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {51}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

فِيهِمَا مِنْ كُلِّ فَاكِهَةٍ زَوْجَانِ {52}

සෑම පලතුරකින්ම ජෝඩුවක් බැගින් ඒ එදෙකහි ඇත.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {53}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

مُتَّكِئِينَ عَلَىٰ فُرُشٍ بَطَائِنُهَا مِنْ إِسْتَبْرَقٍ ۚ وَجَنَى الْجَنَّتَيْنِ دَانٍ {54}

ඇතිරිලි මත හාන්සි වන්නන් ලෙසිනි. එහි ඇතුළත (ඉස්තබ්රක් වර්ගයේ) සේද රෙද්දෙනි. එම උයන් දෙකෙහි පලතුරු සමීපයෙන් පිහිටයි.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {55}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

فِيهِنَّ قَاصِرَاتُ الطَّرْفِ لَمْ يَطْمِثْهُنَّ إِنْسٌ قَبْلَهُمْ وَلَا جَانٌّ {56}

ඒවායෙහි දමිත බැල්මැති පිරිසිදු කන්‍යා කුමරියන් වෙති. ඔවුනට පෙර කිසිදු මිනිසෙකු හෝ ජින්නුවෙකු හෝ ඔවුන් ස්පර්ශ කර නැත.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {57}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

كَأَنَّهُنَّ الْيَاقُوتُ وَالْمَرْجَانُ {58}

නියත වශයෙන්ම ඔවුහු මැණික් හා පබළු මෙන් වෙති.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {59}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

هَلْ جَزَاءُ الْإِحْسَانِ إِلَّا الْإِحْسَانُ {60}

යහපතට යහපත මිස වෙනත් ප්‍රතිඵලයක් ඇත් ද?

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {61}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

وَمِنْ دُونِهِمَا جَنَّتَانِ {62}

ඒ දෙකට අමතරව (තවත්) උයන් දෙකකි.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {63}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

(ඒ දෙක) තද කොළ පැහැයෙන් යුක්තය.	مُدْهَامَّتَانِ {64}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {65}
ඒ දෙකෙහි උතුරා ගලා යන උල්පත් දෙකකි.	فِيهِمَا عَيْنَانِ نَضَّاخَتَانِ {66}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {67}
ඒ දෙකෙහි පලතුරු ද රටඉඳි ද දෙළුම් ද ඇත.	فِيهِمَا فَاكِهَةٌ وَنَخْلٌ وَرُمَّانٌ {68}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {69}
රූමත් යහපත් කාන්තාවෝ ඒවායෙහි වෙති.	فِيهِنَّ خَيْرَاتٌ حِسَانٌ {70}
එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?	فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {71}
කූඩාරම් තුළ සඟවා තබන ලද ලලනාවෝ වෙති.	حُورٌ مَقْصُورَاتٌ فِي الْخِيَامِ {72}

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {73}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

لَمْ يَطْمِثْهُنَّ إِنْسٌ قَبْلَهُمْ وَلَا جَانٌّ {74}

ඔවුනට පෙර කිසිදු මිනිසෙකු හෝ ජින්නුවෙකු හෝ ඔවුන් ස්පර්ශ කර නැත.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {75}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

مُتَّكِئِينَ عَلَىٰ رَفْرَفٍ خُضْرٍ وَعَبْقَرِيٍّ حِسَانٍ {76}

කොළ පැහැති මෙට්ට මත ද අලංකාර බුමුතුරුණු මත ද හාන්සිවන්නන් ලෙස සිටිති.

فَبِأَيِّ آلَاءِ رَبِّكُمَا تُكَذِّبَانِ {77}

එහෙයින් (මිනිස් හා ජින් යන) නුඹලා දෙදෙනාගේ පරමාධිපතිගේ කවර ආශිර්වාදයන් නුඹලා දෙදෙනා බොරු කරන්නෙහු ද?

تَبَارَكَ اسْمُ رَبِّكَ ذِي الْجَلَالِ وَالْإِكْرَامِ {78}

තේජාන්විතභාවයෙන් හා ගෞරවාන්විතභාවයෙන් යුත් නුඹගේ පරමාධිපතිගේ නාමය අති උත්කෘෂ්ට විය.